පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිලිබඳ රාජ්‍ය අමාත්‍යාංශය

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி விவகாரங்கள் இராஜாங்க அமைச்சு

State Ministry of Provincial Councils & Local Government Affairs

පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය

இலங்கை உள்ளூர் ஆளுகை நிறுவகம்

SRI LANKA INSTITUTE OF LOCAL GOVERNANCE

වාර්ෂික වාර්තාව 2019

ஆண்டறிக்கை 2019

ANNUAL REPORT 2019

අංක. 17, මලලසේකර මාවත,
කොළඹ 07

இலக்கம் 17, மலலசேகர மாவத்தை,
கொழும்பு 07

No. 17, Malalasekara Mawatha,
Colombo 07.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

පටුන

පිටු අංක

පරිච්ඡේදය 01 - හැඳින්වීම 03-10

1.1. දැක්ම
1.2. මෙහෙවර
1.3. ආයතනයේ බල වරම
1.4. ප්‍රධාන ක්ෂේත්‍ර
1.5. පාලක සභාවේ පණිවුඩය
1.6. අභිමතාර්ථ
1.7. කළමනාකරණ ව්‍යුහය

පරිච්ඡේදය 02 - සැකැස්ම 11-19

2.1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හැඳින්වීම
2.2. ආයතනික පාලන ප්‍රකාශනය
2.3. පාලක සභාවේ සාමාජිකයන්
2.4. විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

පරිච්ඡේදය 03 - පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල කාර්යසාධනය වැඩි දියුණු කිරීම උදෙසා ආයතනයේ බලවරම සමාලෝචනයට ලක් කිරීම 20-24

3.1. ආයතනයේ උපදේශක සේවා
3.2. ඉලක්ක කණ්ඩායම්
3.3. සම්බන්ධීකරණය සහ අධීක්ෂණය
3.4. ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු
3.5. ජාතික/ ජාත්‍යන්තර පුහුණු සහ අධ්‍යාපන ආයතන සමඟ සබඳතා
3.6. විශේෂ අවස්ථා

පරිච්ඡේදය 04 – 2019 වර්ෂය තුළ ආයතනයේ සමස්ත කාර්යසාධනය 25-51

4.1. ආයතනය විසින් පවත්වන ලද ජාතික මට්ටමේ වැඩසටහන් පිළිබඳ සාරාංශය
4.2. ඉලක්කගත සහ තත්‍ය ප්‍රතිලාභීන්
4.3. අයවැය වෙන් කිරීම සහ සියළුම අංශ වල සත්‍ය වියදම්
4.4. භාණ්ඩාගාර අරමුදල්වල මූල්‍යමය භාවිතය පිළිබඳ සංසන්දනය වර්ෂයන් 2015,2016,2017,2018 සහ 2019
4.5. පසුගිය වසර කිහිපය සඳහා ලාභය / පාඩුව
4.6. ආයතනයේ එක් එක් අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු
4.7. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සිදු කරනු ලබන පැවරුම් / ව්‍යාපෘති / උපදේශක සේවා

පරිච්ඡේදය 05 - මූල්‍ය තොරතුරු 2019 52-94

5.1. විගණන මතය

5.2. අ) මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඇ) ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඈ) දළ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

ඉ) ගිණුම්කරණ සටහන්

පරිච්ඡේදය 06 - සමාප්තිය 95-96

1.0. හැඳින්වීම

දිවයිනේ පළාත් පාලනය සම්බන්ධයෙන් සංවර්ධන ඉදිරි දැක්මක් අවශ්‍ය වූ වාතාවරණයක් තුළ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය බිහි විය. මෙම දැක්ම යතාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 1997 වර්ෂයේදී ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරන ලදී. පළාත් පාලන ක්ෂේත්‍රයේ කාර්යසාධනය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා ජාතික ආයතනයක් නිර්මාණය කිරීමේ වැදගත්කම මෙම කොමිෂන් සභාව මගින් අවධාරණය කරන ලදී. පළාත් පාලන ක්ෂේත්‍රය සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි සෘජුවම දායක විය හැකි සහ ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම වෙනුවෙන් ස්වකීය අභිලාෂයන් මුදුන් පමුණුවා ගත හැකි කාර්යක්ෂම සහ සතුටුදායක සේවයක් ජනතාවට සැපයිය හැකි ස්වයං අධිකාරී බලයක් සහිත ස්වාධීන ක්ෂේත්‍රයක් වශයෙන් සැලකිය යුතු බව ජනාධිපති කොමිෂන් සභාව විසින් සලකනු ලැබීය. මෙම ඉලක්ක අත්පත් කර ගැනීම කෙරෙහි යොමු වී කටයුතු කළ හැකි වඩාත්ම යෝග්‍ය ආයතනය වශයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සලකන ලදී. ජනතාවට ඉතාම සමීප ආයතනයක් වශයෙන් මහජනතාව නියෝජනය කරන නියෝජන ආයතන ව්‍යුහයක් වශයෙන් ක්‍රියා කිරීමේ හැකියාව මෙම ආයතනය සතු වේ. මෙම අභිමතාර්ථ පෙරදැරි කරගනිමින්, වර්ෂ 1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මගින් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ස්ථාපිත කරන ලදී. එහි කර්තව්‍යයන් එම වසරේම ඔක්තෝබර් මස ආරම්භ කරන ලදී.

1.1. *දැක්ම*

"උද්‍යෝගිමත් සහ වගකිව යුතු පළාත් සභා සහ පළාත් පාලන ආයතන පද්ධතියක් ඇති කිරීම සහ ප්‍රජාව වෙත ඉහළ ගුණාත්මකභාවයකින් යුතු සේවාවක් සහතික කිරීම."

1.2. *මෙහෙවර*

"උද්දේශනය, පුහුණුව සහ පර්යේෂණ ඔස්සේ පළාත් සභාවල සහ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ තිරසර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම"

1.3. ආයතනයේ බල වරම

ක්‍රමෝපායික සැලසුම් තුළ දක්වා ඇති ආකාරයට පහත සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වන රාජ්‍ය අංශයේ නියෝජිතායතනයක් වශයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ස්ථාපිත කරන ලදී.

- ❖ රට තුළ යහපාලනය ඇතිවීම සහතික කිරීමේ අරමුණින් පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල අනුයුක්තව කටයුතු කරන සභිකයන්, නිලධාරින් සහ අනෙකුත් සේවකයන් පුහුණු කිරීම සහ එම ආයතන තුළ නිපුණත්වයන් සහිත නිලධාරී මන්ඩලයක් නිර්මාණය කිරීම පළාත් සභා සහ පලාත් පාලන ආයතන වල ආයතනික ව්‍යුහ සහ කළමනාකරණ ශක්‍යතාවයන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදේශක සේවා සැපයීම

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල කළමනාකරණ පද්ධති සහ ක්‍රියාවලීන් ගැඹුරු ඇගයීමකට ලක් කිරීම සඳහා ඉඩකඩ සපයා දීම.

- කළමනාකරණ සංවර්ධනය සඳහා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවලට සහාය සැලසීම.

- පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා ගරු අමාත්‍යවරයාට අවශ්‍ය තොරතුරු ලබා දීම.

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳ පොත් සහ සඟරා පළ කිරීම, තොරතුරු විකාශනය කිරීම සහ සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම සඳහා දේශීය හා ජාත්‍යන්තර ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම

1.4. ප්‍රධාන ක්ෂේත්‍ර



1.5. පාලක සභාවේ පණිවුඩය

වසර විස්සකට පෙර, එනම් 1999 වසරේදී ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල තේරී පත් වූ සභිකයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ශක්‍යතා වර්ධනය කෙරෙහි නැඹුරු වෙමින් පැහැදිලි දැක්මක් සහිතව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) නිර්මාණය කරන ලදී. මෙම කාලවකවානුව තුළ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් රට තුළ සහ රටින් පිටත වශයෙන් පළාත් පාලන ක්ෂේත්‍රය සඳහා වන පුහුණු වැඩසටහන්, ආයතනය තුළ පවත්වන වැඩසටහන් සහ විදෙස් වැඩසටහන් වශයෙන් පවත්වා ඇත. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය තුළ ස්ථාපිත කරන ලද ඉංජිනේරු, නීති කටයුතු, භෞතික සැලසුම්, මූල්‍ය කළමනාකරණ, සාමාන්‍ය කළමනාකරණය සහ මානව සම්පත් කළමනාකරණය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් වැනි අංශ මගින් පළාත් පාලනයට අදාළ පුළුල් පරාසයක විෂයයන් මෙම පුහුණු වැඩසටහන් මගින් ආවරණය කරනු ලැබේ. මෙම මෙහෙවර හා සමගාමීව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සාර්ව ආර්ථික පාලන ප්‍රතිපත්ති, සහ මූල්‍ය සහ නෛතික ගැටළු පිළිබඳ සංඛ්‍යාලේඛන ආශ්‍රිත පුහුණු අවස්ථා 50000 කට වැඩි රජයේ නිලධාරීන් සහ තේරී පත් වූ සභිකයන් සඳහා ලබා දී ඇත. ලොව පුරා ව්‍යාප්ත වී පවතින දැනුම මෙම කලාපය වෙත රැගෙන ඒම සඳහා සහ ආසියානු කලාපයට අදාළ පාඩම් හා සාර්ථකත්වය පිළිබඳ විස්තර දැක්වීම් අවධාරණය කිරීම සඳහා දේශන, වැඩමුළු හා සිද්ධි අධ්‍යයන ද සංවිධානය කෙරේ. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ආශ්‍රිත ක්ෂේත්‍රයන්ට අදාළ කාලීන මාතෘකා පිළිබඳව අධ්‍යයන, පර්යේෂණ සහ උපදේශක කටයුතුද සිදු කරනු ලැබේ.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, එමගින් සපයනු ලබන පුළුල් පරාසයකින් යුතු සේවාවන් සමූහය ඔස්සේ, අවශ්‍ය හැකියා සහ කුසලතා නිර්මාණය කිරීමේ පහසුකම් සැපයීම මගින් තම සේවාදායක පිරිස තුළ යම් සංවර්ධනයක් ඇතිකිරීම සඳහා සහ රාජ්‍ය අංශය තුළ පළාත් පාලන අවශ්‍යතා ඉටු කරගැනීමේදී යෝග්‍ය වන මැදිහත්වීම් සහ ක්‍රමෝපාය පිළිබඳව තීරණය කිරීම සඳහා බලවත් ප්‍රයත්නයක් දරයි. ප්‍රාදේශීය සංවර්ධන ක්ෂේත්‍රය තුළ සියළුම මට්ටම් තුළ දී ව්‍යක්තීයමයභාවය ඉහළ නැංවීමේ ප්‍රයත්නය තුළ සියළුම පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය සහභාගිත්වය අපි බලාපොරොත්තු වෙමු. අපගේ සාර්ථකත්වය පිළිබඳ එකම පරාමිතිය පළාත් පාලන ආයතනවල සාර්ථකත්වය වන අතර අනෙක් අතට එය මහජනතාවගේ සාර්ථකත්වය මත රඳා පවතී.

මෙම උත්සාහයන් සිදු කිරීමේදී, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය අප රටේ අවශ්‍යතාවයන් උදෙසා සිය වැඩසටහන් නිර්මාණය කිරීමේ ඉලක්කයට අනුව කටයුතු කරනු ලැබේ. කලාපීය ප්‍රවීණත්වය කෙරෙහි අවධානය යොමු කිරීමත් අපගේ කලාපීය පුහුණු හවුල්කරුවන් සමගින් සහයෝගයෙන් කටයුතු කිරීම හා දැනුම බෙදා හදා ගැනීමත් අප විසින් අඛන්ඩවම සිදු කරමු.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සපයන ලද විසි වසරක සේවය පිළිබඳව අපි ස්තුතිවන්ත වෙමු.

1.6. අභිමතාර්ථ

ඉහත මෙහෙවර, පහත අභිමාතර්ථ අත්පත් කර ගැනීම කෙරෙහි යොමු වී පවතී. ;

1. පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සමඟ හවුල්කාරිත්වයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන, ආයතනික වශයෙන් සවිමත් කිරීම ඉහළ නැංවීම සඳහා කාර්යසාධනය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් සම්පාදනය කිරීම.

2. පළාත් සභා සහ පළාත් පාලන ආයතන ව්‍යුහයන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහ ඒවාට සහාය සැළසීම සඳහා පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීම හා පුහුණු අවස්ථා උදා කිරීම කෙරෙහි නැඹුරු වෙමින් පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවල ශක්‍යතාවයන් ඉහළ නැංවීම.

3. පළාත් පාලනයට අදාළ පාර්ශ්වකරුවන් හට තාක්ෂණික සහ අනෙකුත් තොරතුරු සපයනු ලබන, පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා වන සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වීම.

4. අදාළ ජාතික සහ ජාත්‍යන්තර ආයතනයන් සමඟ සහයෝගීත්වයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා කේන්ද්‍රීය ආයතනය වශයෙන් කටයුතු කිරීම.

5. මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා විශේෂ සහාය සේවා සැපයීම සහ උප ජාතික මට්ටමේ රාජ්‍ය ආයතනවල ආයතනික වෙනස්කම් සඳහා පහසුකම් සැලසීම.

6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා පුහුණු, උපදේශන සහ පර්යේෂණ සේවා කාර්යක්ෂම සහ සාධනීය ආකාරයෙන් සැපයීමට හැකියාව නිර්මාණය වන පරිදි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම

එම අභිමතාර්ථ ඉටු කිරීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පහත කටයුතු සිදු කරනු ලැබේ.

- ජාතික මට්ටමේ / පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් / වැඩමුළු
- ජාත්‍යන්තර / ජාතික සම්මන්ත්‍රණ
- ප්‍රායෝගික පුහුණු සැසි

  උදා : (අ) අතුරු නීති පිළියෙල කිරීම
  (ආ) පළාත් පාලන ආයතනවල අවසන් ගිණුම් පිළියෙල කිරීම
- ඩිප්ලෝමා පාඨමාලා:

  (අ) පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාව (තේරී පත් වූ සභිකයන් සඳහා)
  (ආ) පළාත් පාලනය පිළිබඳ ඩිපලෝමාව (නිලධාරීන් සඳහා)

- **සහතික පත්‍ර පාඨමාලා**

  (අ) ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

  (ආ) පළාත් පාලන ආයතනවල විමර්ශන නිලධාරින් සඳහා සහතික පත්‍ර පාඨමාලාව

  (ඇ) පරිසනක යෙදවුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

  (ඈ) පළාත් පාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (උඟව පළාත)

- පර්යේෂණ

- උපදේශක සේවා

- අත්පොත් සහ පත්‍රිකා පළ කිරීම

- ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය තෙමසකට වරක් 'පළාත් පාලන' නමින් සිංහල හා දෙමළ භාෂා වලින්ද, වාර්ෂිකව 'Local Governance Journal' (පළාත් පාලන ජර්නලය) ද පළ කරනු ලැබේ.

1.7. <u>පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කළමනාකරණ ව්‍යුහය</u>



**** *කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ පවත්වන සාකච්ඡා පරිදි කළමනාකරණ ව්‍යුහය වෙනස් කෙරෙනු ඇත.*

1.8. දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය



පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG), පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු සමඟ පවත්වන ලද සාකච්ඡා කිහිපයකින් අනතුරුව එහි ආයතනික ව්‍යුහය දැනටමත් ප්‍රතිනිර්මාණය කොට ඇත. තවදුරටත්, අපගේ යෝජනාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අප විසින් පියවර ගනු ලැබූ අතර එය තවදුරටත් සාකච්ඡාවට ලක් වෙමින් පවතී.

කෙසේ වුවද, පළාත් පාලන ආයතන ක්ෂේත්‍රය සඳහා වඩා කාර්යක්ෂම සහ සාධනීය සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා කාර්යමණ්ඩලයේ කාර්යසාධනය සහ සිදුකරන කාර්යයන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. එම නිසා, වඩා කාර්යක්ෂම සහ සාධනීය සේවා සැපයුමක් සහතික කිරීමේ අරමුණින්, කාර්ය මණ්ඩලයේ දැනුම සහ අවබෝධය ඉහළ නැංවීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් කාර්ය මණ්ඩල සංවර්ධනය වෙනුවෙන් විවිධ වැඩසටහන් සංවිධානය කොට ඇත.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා ස්වකීය ශක්‍යතා වර්ධන අවස්ථා වැඩි දියුණු කර ගැනීමට ජාතික සහ ජාත්‍යන්තර මට්ටම් වල බාහිර පුහුණු අවස්ථා ද සැලසේ.

දැනට ආයතනයේ සිටින කාර්ය මණ්ඩලය නම් සහ තනතුරු සහිතව පහතින් දක්වා ඇත.

අංකය	නම	තනතුර
01	ඊ.එම්.ඩී.බී. ඒකනායක මහතා	අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
02	ආර්.එම්.ඒ.කේ. රත්නායක මහතා	අතිරේක අධ්‍යක්ෂ
03	පී.එස්. ධර්මරත්න මහතා	උපදේශක (පර්යේෂණ)
04	කේ.ඒ.පී.ආර්. කාරියප්පෙරුම මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුහුණු)
05	පී.ඒ.ඩී. හිරාන් රදීෂ මහතා	ගිණුම් නිලධාරී / අතිරේක අධ්‍යක්ෂ (මුදල්) - ආවරණ
07	එස්.ඒ.එස්.එස්.එන් පෙරේරා මිය	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික සහකාර
08	ඒ.ඊ. සමරරත්න මහතා	පරිපාලන නිලධාරී
09	අන්ජන දොඩම්ගොඩ මහතා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
10	එස්.එන්.පී. රෝසා මෙය	වැඩසටහන් නිළධාරී
11	ඩී.එම්. ජගත් පුෂ්පකුමාර මහතා	වැඩසටහන් නිළධාරී
12	එම්.ඩී.අයි.ඩී. විජේමාන්න මෙනවිය	වැඩසටහන් නිළධාරී
13	ආර්.එම්.ජී.කේ. රණසිංහ මෙය	වැඩසටහන් නිළධාරී
14	ඒ.ඩී. වීරසේකර මෙය.	වැඩසටහන් නිළධාරී
13	ජී.බී.එම්.එස්.පී. බණ්ඩාර මෙය.	වැඩසටහන් නිළධාරී
15	සුරේෂ් කුමාර මහතා	වැඩසටහන් නිළධාරී
16	හේමා රත්නායක මෙය.	කළමනාකරණ සහකාර
17	ඕ.ඩබ්.ටී.පී. ඕවිටිපාන මෙය.	කළමනාකරණ සහකාර
18	එච්.ඩී.එම්. ප්‍රියදර්ශනී මෙය.	කළමනාකරණ සහකාර
19	ඩී.එම්.ටී. රන්දුණු මෙය.	කළමනාකරණ සහකාර
20	එම්.එස්.සී. විමලවීර මෙය.	කළමනාකරණ සහකාර
21	ඒ.පී. රත්නහේවා මෙය.	කළමනාකරණ සහකාර
22	බී.ජී.සී.බී. කරුණාරත්න මහතා	රියැදුරු
23	එල්.එස්. සම්පත් මහතා	රියැදුරු
24	එන්.එච්.ඩී. තුෂාර මහතා	රියැදුරු
25	ආර්.ආර්.පී.ඩබ්. සුජත් බණ්ඩාර මහතා	රියදුරු
26	එල්.යූ.එස්.ආරියසිංහ මහතා	රියැදුරු
27	බී.ජී. ඩිංගිරි අම්මා මෙනවිය	කාර්යාල සහායක
28	කේ. කමල් ක්‍රිශාන්ත මහතා	කාර්යාල සහායක
29	ඒ.ඒ.එච්.එන්. අධිකාරි මහතා	කාර්යාල සහායක
30	එන්.එස්.ඩී. පෙරේරා මහතා	කාර්යාල සහායක

2.0. සැකැස්ම

2.1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හැඳින්වීම

පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට ජනතාව සඳහා වඩා කාර්යක්ෂම සහ සතුටුදායක සේවාවක් සැපයීමට හැකියාව නිර්මාණය වන පරිදි ඒවායේ ආයතනික පද්ධති සහ කළමනාකරණ විශිෂ්ඨත්වය වැඩි දියුණු කිරීම මෙම ආයතනයේ මූලික අභිමතාර්ථය වේ. 1987 වර්ෂයේදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දීමත් සමග පරිපාලනය බලතල විමධ්‍යගත කිරීම ආරම්භ විය. පරිපාලන බලතල පවරා දීම පිළිබඳ පරමාර්ථ මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අභිමතාර්ථද අත්පත් කර ගැනීම සඳහා ලැබී ඇති බලතල නිවැරදි ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය යන්න මෙහිදී අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව, පළාත් සභා මට්ටමින් ආයතනික පරිපාලන භූමිකාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන ලදී.

ඉහතින් සඳහන් කොට ඇති පරිදි, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ස්ථාපිත කොට වසර 21 ක් ගත වී ඇත. මෙම කාලසීමාව අතරතුර ආයතනය විසින් වාර්ෂිකව කියාත්මක කළ යුතු වන සැළසුම් ක්‍රියාවට නංවා තිබෙන අතර ආයතනයේ පාලක සභාවේ මහපෙන්වීම යටතේ ආයතනයේ අරමුණු සහ අභිමතාර්ථ සාධනීය ආකාරයෙන් සංකල්පගත කොට නිර්මාණය කර ඇත. ඉතා කෙටි කාලසීමාවක් තුළ මෙලෙස සංකල්පගත කෙරුණු අරමුණු සහ අභිමතාර්ථ සාර්ථකව අත්පත් කර ගැනීමේදී ජාත්‍යන්තර පළාත් පාලන ආයතනවල මෙන්ම දේශීය පුහුණු ආයතනවලින්ද අනර්ඝ සහයෝගයක් ආයතනයට ලැබී ඇත. එසේම ආයතනයේ කාර්යමණ්ඩලය ලබා දුන් දායකත්වයද ආයතනයේ පරමාර්ථ අත්පත් කර ගැනීමේදී මහෝපකාරී විය.

කෙසේ වුවද, විමධ්‍යගත කිරීමේ වැඩසටහන, විශේෂයෙන්ම ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය තුළදී අභිමාතර්ථවලින් යම් දුරස්ථ වීමක් පෙන්නුම් කරනු ලැබේ. මේ සඳහා පහත උදාහරණ දැක්විය හැකිය :

- විමධ්‍යගත කිරීම තුළින් ඇතිවන කාර්යක්ෂමභාවය ඉහළ යාම සහ කඩිනම් සහ ප්‍රමුඛ අවධානය යොමු විය යුතු සමාජ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේදී ඒ සඳහා සම්පත් බෙදී යාම සහතික කිරීම
- ප්‍රතිපත්ති සම්පාදනය තුළදී විමධ්‍යගත කිරීමේ ප්‍රතිචාර දැක්වීම ඉහළ නැංවීමේ හැකියාව සහ ඉලක්ක කන්ඩායම් වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- දරිද්‍රතාවය අවම කිරීමේදී සහ සංවර්ධන ක්‍රියාකාරකම් වලදී විමධ්‍යගත කිරීමෙන් ලැබෙන සාධනීය බලපෑම
- විශේෂයෙන්ම දරිද්‍රතාවයට ලක් ව සිටින ජනතාව සහ පුරවැසියන් කෙරෙහි දක්වන ඉහළ ප්‍රමුඛතාවය පිළිබිඹු වන අන්දමින්, මෙම මට්ටම්වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම
- බිම් මට්ටමේ සිටින ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා එම ප්‍රජාවන්හි මැදිහත්වීමද සහිතව තීරණ ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම.

2019 වර්ෂයේ නොවැම්බර් මස වන විට පැවති පළාත් පාලන ආයතන සංඛ්‍යාව 341 කි. (මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276) සියළුම පළාත් පාලන ආයතන සඳහා සාමාජිකයන් තෝරා ගනු ලබන්නේ මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් මගිනි. පලාත් පාලන ආයතන බෙදී යාම පහත පරිදි වේ.

පලාත	දිස්ත්‍රික්කය	මහනගර සභා ගණන	නගර සභා ගණන	ප්‍රාදේශීය සභා ගණන	මුළු එකතුව
බස්නාහිර	කොළඹ	06	05	03	14
	ගම්පහ	01	05	12	18
	කළුතර	00	04	13	17
වයඹ	වකුරුණෑගල	01	01	19	21
	පුත්තලම	00	02	10	12
මධ්‍යම	මහනුවර	01	04	17	22
	මාතලේ	02	00	11	13
	නුවර එළිය	01	02	09	12
සබරගමුව	කෑගල්ල	00	01	11	12
	රත්නපුර	01	02	14	17
ඌව	බදුල්ල	02	01	15	18
	මොනරාගල	00	00	10	10
උතුරු මැද	අනුරාධපුරය	01	00	17	18
	පොලොන්නරුව	01	00	07	08
දකුණු	ගාල්ල	01	02	17	20
	මාතර	01	01	15	17
	හම්බන්තොට	01	01	10	12
උතුරු	යාපනය	01	03	14	18
	කිලිනොච්චි	00	00	03	03
	මන්නාරම	00	01	04	05
	වව්නියාව	00	01	04	05
	මුලතිවු	00	00	04	04
නැගෙනහිර	අම්පාර	02	01	17	20
	ත්‍රිකුණාමලය	00	02	11	13
	මඩකලපුව	01	02	09	12
එකතුව					**341**
2019 වර්ෂයේදී තෝරා පත්කරගත් සම්පූර්ණ සභිකයින් ප්‍රමාණය					***8570***

පළාත් පාලන ආයතන යනු මහජනතාව වෙත ප්‍රාදේශීය සේවාවන් ඉටු කර දෙන මූලික සේවා සැපයීමේ ආයතන වන බැවින්, වර්තමාන යහ පාලන රජයේ කැපවීම් සහගත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මනා අවබෝධයක් සහ දැනුවත්භාවයක් සහිතව තීරණ ගැනීමත් විනිවිදභාවය සහ වගවීම අවධාරණය කිරීමත් සහිකයින්ගේ කාර්යභාරය වේ.

ඒ ආකාරයට, සෑම වසරකම ඉලක්කය විය යුත්තේ පළාත් පාලන ආයතන සහ පළාත් සභා විසින් ඉටු කිරීමට කැප වී සිටින පළාත් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් කෙරෙහි යොමුවන ආකාරය පෙන්වා දීම සහ ඒ අනුව පළාත් පාලන ආයතන සහ පළාත් සභාවන්හි ශක්‍යතා වර්ධන ක්‍රියාවලිය නිසි පරිදි පෙළගැස්වීමයි.

2.2.ආයතනික පාලන ප්‍රකාශනය

ආයතන නාමය	: පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (1999 අංක 31 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපනය කරන ලදී.)
මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනය	: 15.10.1999
ලියාපදිංචි කාර්යාලය	: අංක 17, මලලසේකර මාවත, කොළඹ 07.
විගණකවරු	: විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
බැංකුකරුවන්	: ලංකා බැංකුව, නිදහස් චතුරස්‍ර ශාඛාව, කොළඹ 07.
විදේශීය සංගම්	: (අ) පොදු රාජ්‍ය මන්ඩලීය පළාත් පාලන සංසදය (CLGF) (ආ) ආසියා සහ ශාන්තිකර කළාපීය පළාත් පාලන පුහුණු සහ පර්යේෂණ ජාලය (LOGOTRI)
දේශීය සංගම්	: a) යුඑස්ඒඩ් (UNDP) b) යූ.එන්.හැබිටැට් (UNHABITAT) c) CHRYSALIS
අනුබද්ධ ව්‍යාපෘති / පැවරුම්	: (අ) ශ්‍රී ලංකා නගර වල තත්ත්වය ව්‍යාපෘතිය (ඇ) UNDP අරමුදල් සැපයෙන පළාත් පාලන ආයතන සඳහා නව ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දීමේ වැඩසටහන

2.3. පාලක සභාවේ සාමාජිකයන්

2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ පාලක සභාව

නිල බලයෙන් පත් කරනු ලැබූ සාමාජිකයන් 08 දෙනෙකු සහ පත් කරනු ලැබූ සාමාජිකයන් 05 දෙනෙකු ඇතුළුව සාමාජිකයන් 13 දෙනෙකුගෙන් පාලක සභාව සමන්විත වේ.

නිල බලයෙන් පත් කළ සාමාජිකයන් සහ පත් කරනු ලැබූ සාමාජිකයන් පහත දැක්වේ.

- එච්. ටී. කමල් පත්මසිරි මහතා (2019 අප්‍රේල් දක්වා)
  ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - සභාපති
  සහ
  එච්.එම්. ගාමිනී සෙනෙවිරත්න මහතා (2019 අගෝස්තු සිට)
  ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් සභා සහ පලාත් පාලන ආයතන

- එම්. එම්. පී. කේ. මායාදුන්නේ මහතා - සාමාජික
  ලේකම්, නගර සැලසුම්කරණ සහ ජල සම්පාදන අමාත්‍යාංශය

  අනුර දිසානායක මහතා
  ලේකම් - මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය - සාමාජික

- එම්. ඒ. ආර්. බී. දිසානායක මහතා (2017 ජුනි සිට) - සාමාජික
  ලේකම් - මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය

- ඩී. ස්වර්ණපාල මහතා - සාමාජික
  ලේකම් - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

- ආචාර්ය එම්. කේ. සී. සේනානායක (2016 ඔක්තෝබර් සිට) - සාමාජික
  අධ්‍යක්ෂ - මුදල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

- ආචාර්ය යූ. අනුර කුමාර මහතා - සාමාජික
  පීඨාධිපති - කළමනාකරණ පීඨය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

- ඩී. පී. හෙට්ටිආරච්චි මහතා - සාමාජික
  නිටපු අතිරේක ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

- ඉසෙඩ් ඒ. එම්. අහමඩ් මහතා - සාමාජික
  නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්

- රේණුකා එම්. වීරකෝන් මහත්මිය - සාමාජික
  නීතිඥ

- එන්. එම්. එම්. නින්සර් මහතා - සාමාජික
  සභාපති – JIC (පෞද්ගලික) සමාගම

- සුජීව සමරවීර මහතා - සාමාජික
  අධ්‍යක්ෂ - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සහ කැඳවුම්කරු

පාලක සභාවේ ලේකම්

- නිරංජලා පෙරේරා මෙනවිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීගේ
  පෞද්ගලික සහකාර

ආයතනයේ ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය ආශ්‍රිත සියළු තීරණ ගනු ලබන්නේ පාලක සභාව විසිනි. ආයතනයේ පාලක සභාව, හඳුනා ගත් අමාත්‍යාංශ වල ලේකම්වරුන් සහ වෘත්තීය ආයතන වල නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙහි සභාපතිවරයා වනුයේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂවරයා, පාලක සභාවේ කැඳවුම්කරු මෙන්ම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ද වේ. ඔහු කටයුතු කරනුයේ පාලක සභාවේ සමස්ත මඟපෙන්වීම යටතේය. අතිරේක අධ්‍යක්ෂවරයා සහ උපදේශක කන්ඩායමකින්ද නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ සහායක කාර්යමණ්ඩලයෙන්ද ආධ්‍යක්ෂවරයාට සහාය සැලසේ.

පළාත්පාලනය සඳහා වන ශ්‍රී ලංකා ආයතනය දැනට අංශ නවයකට බෙදෙන සේ නිර්මාණය කොට තිබෙන අතර පොදු කළමනාකරණය සහ මානව සම්පත් කළමනාකරණ අංශය, ඉංජිනේරු අංශය, භෞතික සැලසුම් අංශය, මූල්‍ය කළමනාකරණ අංශය, නීති සහ ව්‍යවස්ථාදායක කටයුතු අංශය, පර්යේෂණ සහ පළකිරීම් අංශය, ආයතනික ශක්‍යතා වර්ධන අංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය, පරිපාලන අංශය සහ ගිණුම් වශයෙන් ඒවා දැක්විය හැකිය.

	පාලක සභා සාමාජිකයන්ගේ නම්	පාලක සභාවේ දරන තනතුර	පැමිණි දින ගණන				මුළු දින ගණන
			රැස්වීම් අංක. 165 2019 අප්‍රේල් 09	රැස්වීම් අංක. 166 2019 අගෝස්තු 06	රැස්වීම් අංක. 167 2019 සැප්තැම්බර් 26	රැස්වීම් අංක. 168 2019 ඔක්තෝබර් 28	
1	එච්. ටී. කමල් පත්මසිරි මහතා (2019 අප්‍රේල් දක්වා) ලේකම් - පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය සහ එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න මහතා (2019 අගෝස්තු මස සිට) ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය	සභාපති	√	√	√	√	**04**
2	එම්.එම්.පී.කේ. මායාදුන්නේ මහතා ලේකම් - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය	සාමාජික	පැමිණ නැත	පැමිණ නැත	√	√	**02**
3	අනුර දිසානායක මහතා ලේකම් 0 මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය	සාමාජික	√	පැමිණ නැත	පැමිණ නැත	-	**01**
4	බර්නාඩ් වසන්ත මහතා ලේකම්, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	සාමාජික	පැමිණ නැත	පැමිණ නැත	√	√	**02**
5	බී.එම්.එම්.එම්. බස්නායක මහතා (2019 අගෝස්තු සිට) අතිරේක ලේකම් - විමර්ශන, ඇගැයීම් සහ පර්යේෂණ) රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශය	සාමාජික	පැමිණ නැත	√	√	-	**02**
6	ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා අධ්‍යක්ෂ - ෆිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් හා සැලසුම් අමාත්‍යාංශය	සාමාජික	√	√	පැමිණ නැත	√	**03**
7	ආචාර්ය යූ. අනුර කුමාර මහතා පීඨාධිපති - කලමනාකරණ පීඨය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	සාමාජික	√	පැමිණ නැත	√	පැමිණ නැත	**02**
8	නවීන් ශානක හෙට්ටියාදුරගේ මහතා නීතිඥ	සාමාජික	√	√	පැමිණ නැත	√	**03**
9	ඩී.එච්.පී.ඒ. එස්. ද සිල්වා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - සෞඛ්‍යය අමාත්‍යාංශය	සාමාජික	√	√	√	√	**04**
10	බුද්ධි ජයවර්ධන මහතා	සාමාජික	පැමිණ නැත	පැමිණ නැත	පැමිණ නැත	පැමිණ නැත	**00**
11	ආනන්ද වික්‍රම මහතා	සාමාජික	පැමිණ නැත	√	පැමිණ නැත	පැමිණ නැත	**01**
12	එම්.එස්.එම්. රිස්මි මහතා / ඊ.එම්.ඩී.බී. ඒකනායක මහතා අධ්‍යක්ෂ - පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	කැඳවුම්කරු	√	√	√	√	**04**
			07	**07**	**07**	**07**	

2.4. විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයන්

පහත දැක්වෙන සාමාජිකයන් 2019 වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටුවේ කටයුතු වල නිරත වන ලදී.

(අ) ආචාර්ය එම්. කේ. සී. සේනානායක මහතා - සභාපති
අධ්‍යක්ෂක - මූල්‍ය සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

(ආ) නවීන් ශානක හෙට්ටියාදුරගේ මහතා
නීතිඥ - සාමාජික

(ඇ) ඊ. එම්. ඩී. බී ඒකනායක මහතා (2019 අප්‍රේල් දක්වා) - සාමාජික
පාලක සභා සාමාජික

(ඈ) ඊ. එම්. ඩී. බී. ඒකනායක මහතා (2019 ජූලි මස සිට) - සාමාජික
අධ්‍යක්ෂ - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
පාලක සභා සාමාජික

(ඉ) අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

බාහිර නිරීක්ෂකයින්

(ඊ). අශෝක ධනපාල මහතා
විගණන අධිකාරී - විගණකාධිපති දෙපාර්තමේන්තුව

(උ) ඩී. එස්. ආර්. ප්‍රනාන්දු මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

විගණන සහ කළමනාකරණ කමිටුවේ ලේකම්

(ඌ). නිරංජලා පෙරේරා මෙනවිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීගේ
පෞද්ගලික සහකාර

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්ය මණ්ඩලයෙන්

(එ). හිරාන් රදීෂ මහතා
ගිණුම් නිලධාරී / සහකාර අධ්‍යක්ෂ (මුදල්) සඳහා ආවරණ රාජකාරී

(ඒ). අසේල සමරරත්න මහතා
පරිපාලන නිලධාරී

විගණන හා කළමනාකරණ කමිටුව පාලක සභාවේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මහා භාණ්ඩාගාර නියෝජිතයෙකු වූ ආචාර්ය එම්. කේ. සී. සේනානායක මහතා එහි සභාපතිත්වය දැරූ අතර පාලක සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටුවට පත් කිරීම සඳහා නම් කරනු ලැබූ නිලධාරීන් වූයේ නවීන් ශානක හෙට්ටියාදුරගේ මහතා සහ ඊ.එම්.ඩී.බී. ඒකනායක මහතා ය. එයට අමතරව, විගණකාධිපති දෙපාර්තමේන්තුව භාරව විගණන අධිකාරීවරයාද පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ද ප්‍රධාන නිරීක්ෂකයන් වශයෙන් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වලට සහභාගි විය.

පරිපාලන නිලධාරිවරයා සහ ගිණුම් නිලධාරී / සහකාර අධ්‍යක්ෂ - මුදල් (ආවරණ) මෙන්ම අනෙකුත් අදාළ තනතුරු දරණ නිලධාරීන්ද විගණන හා කළමනාකරණ කමිටුව විසින් කැඳවනු ලැබීමෙන් අනතුරුව පැහැදිලි කිරීම සිදු කිරීම සඳහා අවශ්‍ය ඕනෑම විටෙකදී කමිටුව හමුවේ පෙනී සිටියහ.

අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබන්නේ අභ්‍යන්තර විගණන අංශය විසිනි. විගණන විෂය පථය යටතේ වන මෙහෙයුම් කටයුතු පරිපාලන, මුදල් සහ මෙහෙයුම් අංශ ආවරණය කරමින් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. එයට අමතරව, මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම හා සමගාමීව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් කටයුතු, පරිපාලන සහ මුදල් අංශ ආශ්‍රිතව පවත්නා අඩුපාඩු මෙන්ම ඇගයීම් ආශ්‍රිත අභ්‍යන්තර පාලන පිළිබඳ දුර්වලතාවයන් ද හඳුනාගන්නා ලදී. කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීම මගින් අභ්‍යන්තර විගණන වාර්තාව සම්බන්ධයෙන් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම අරබයා ක්‍රියාමාර්ග ගන්නා ලදී. ආයතනයේ අභ්‍යන්තර චක්‍රලේඛ, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ අනෙකුත් රෙගුලාසි වලට අනුකූලව ආයතනයේ කටයුතු සිදු කෙරෙන බවට සහතික කර ගැනීම සඳහා විගණනය සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ආයතනයේ වත්කම් සංරක්ෂණය කිරීම සහ නඩත්තුව සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ද්‍රවශීලතාවය පවත්වාගැනීම ඇතුළු සියළුම මූල්‍ය, පරිපාලන සහ මෙහෙයුම් කටයුතු මෙම ව්‍යායාමය තුළදී විගණනයට භාජනය විය.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් ගිණුම් නිලධාරියා / සහකාර අධ්‍යක්ෂ මුදල් (ආවරණ) විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රගතිය පිළිබඳ වාර්තා පරීක්ෂාවට ලක් කොට ඒ සම්බන්ධයෙන් ගත යුතු වන ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ පාලක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබීය. විගණන හා කළමනාකරණ කමිටුව එහි රැස්වීමේදීම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ පිළිබඳව සාකච්ඡා කරන ලදී.

එයට අමතරව විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා වලින් අනාවරණය කරගන්නා කරුණු සහ විගණන ක්‍රමවේදයන්ගේ සාධනීයභාවය ඇගයීමට ලක් කොට දුර්වලතාවයන් අවම කරවා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම සපයන ලදී. මෙම වසර තුළදී විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අවස්ථා තුනකදී රැස්වීම් පවත්වා ඇත.

සටහන: පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි අභ්‍යන්තර විගණණ ධූරය දැරූ රංජිත් ලියනාරච්චි මහතා ධූරයෙන් ඉවත් වීම හේතුවෙන් ද නව අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීම ප්‍රමාද වීමෙන් ද විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලද්දේ පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි අධ්‍යක්ෂ වරයාගේ සෘජු අධීක්ෂණය යටතේය.

තවද, ඊ. එම්. ඩී. බී. ඒකනායක මහතා පාලක සභාව සාමාජිකයකු මෙන්ම විගණන සහ කලමනාකරණ කමිටුව මගින් පත් කළ පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කළද විගණන සහ කලමනාකරණ කමිටුව වෙත නව නම් කිරීමක් පාලක සභාව විසින් ඒකනායක මහතාගෙන් පුරප්පාඩු වී තනතුර සඳහා ලබා නොදෙන ලදී.

	විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයන්ගේ නම්	**කමිටුවෙහි දරන තනතුර**	**පාලක සභා රැස්වීම් දින**			**සැම්මූ දින ගණන**
			රැස්වීම් අංක 01 2019 අප්‍රේල් 30	**රැස්වීම් අංක 02 2019 ජූනි 11**	**රැස්වීම් අංක 03 2018 සැප්තැම්බර් 11**	
1	ආචාර්ය එම්.කේ.සී. සේනානායක අධ්‍යක්ෂක - ෆිස්කල් ප්‍රතිපත්තිය පිළිබඳ දෙපාර්තමේන්තුව, මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශය සහ **පාලක සභා සාමාජික**	සභාපති	√	√	√	**03**
2	නිවින් ශානක හෙට්ටියාදුරගේ මහතා **පාලක සභා සාමාජික**	සාමාජික	√	√	√	**03**
3	ඊ. එම්. ඩී. බී. ඒකනායක මහතා **පාලක සභා සාමාජික**	සාමාජික	√	√	√	**03**
4	අභ්‍යන්තර විගණන නිලධාරී - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	කැඳවුම්කරු	-	-	-	**00**
බාහිර						
5	අශෝක ධනපාල මහතා විගණන පරීක්ෂක - විගණන දෙපාර්තමේන්තුව	නිරීක්ෂක	√	√	√	**03**
6	ඩී. එස්. ආර්. ප්‍රනාන්දු මහතා ප්‍රධාන අභ්‍යන්තර විගණක, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	නිරීක්ෂක	√	√	√	**03**
			05	**05**	**05**	

නිරංජලා පෙරේරා මහත්මිය, (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීගේ පෞද්ගලික සහකාර)*විගණන හා කළමනාකරණ කමිටුවේ ලේකම්වරිය විය.*

3.0. ආයතනයේ බලවරම සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ආයතනය සතු භූමිකාව සමාලෝචනය කිරීම

3.1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සපයනු ලබන උපදේශක සේවය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් උපදේශක සේවා ලබා දීම සඳහා ප්‍රධාන අංශ නවයක් (09) පිහිටුවා තිබේ. ඒවා නම් :

(අ) ඉංජිනේරු

(ආ) පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන

(ඇ) භෞතික සැලසුම්

(ඈ) මූල්‍ය කළමනාකරණ

(ඉ) නීති සහ නීති සම්පාදන කටයුතු

(ඊ) පර්යේෂණ

(උ) පුහුණු සහ සංවර්ධන

(ඌ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

(එ) අපද්‍රව්‍ය කලමනාකරණ සහ පාරිසරික ආරක්ෂණ

3.2. ඉලක්ක කණ්ඩායම

මෙම ආයතනය විසින් සිදු කරනු ලබන, පුහුණු, පර්යේෂණ සහ උපදේශක සේවා යනාදියේ ප්‍රතිලාභීන් වන්නේ පිළිවෙලින් තෝරා පත් කර ගත් නියෝජිතයන්ගෙන් සහ නිලධාරීන්ගෙන් සමන්විත පළාත් සභා 09 සහ පළාත් පාලන ආයතන වේ.

එක් එක් ඉලක්කගත කණ්ඩායම් වර්ගය අනෙක් ඒවායින් වෙනස් වේ. පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සමග සිදු කරන ලද පුහුණු අවශ්‍යතා විශ්ලේෂණ සහ සාකච්ඡා තුළින් හඳුනාගනු ලැබූ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි මෙම වැඩසටහන් සැලසුම් කොට ඇත. පළාත් මට්ටමින් වැඩසටහන් සැලසුම් කිරීම සම්බන්ධයෙන්ද අප ආයතනය විසින් සහයෝගී භූමිකාවක් දරා ඇත.

3.3. සම්බන්ධීකරණය සහ අධීක්ෂණය

පළාත් කළමනාකරණ සංවර්ධන ඒකක මගින් සහ පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පවත්වනු ලබන පුහුණුවීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම මෙම ආයතනය විසින් සිදු කරන වැදගත් කාර්ය භාරයක් වශයෙන් සැලකේ. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනයට ලක් කරනු ලබන්නේ පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වනු ලබන මාසික සමාලෝචන රැස්වීම් මගින් ය.

<u>පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පැවැත්වූ පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක රැස්වීම්</u>





3.4. ව්‍යාපාර ප්‍රවර්ධනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සතු පසුගිය අත්දැකීම් වලින් පෙනී ගොස් ඇත්තේ විවිධ රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන බොහොමයක් ඒවායේ පළාත් පාලනය පිළිබඳ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සහාය අපේක්ෂා කරන බවයි. ප්‍රතිඵල කෙරෙහි නැඹුරු වූ ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා මෙහිදි සියළුම ක්‍රියාකාරකම් යම් තෝරා බේරාගැනීමකට ලක් කිරීම අවශ්‍ය වේ. මෙම ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු SLILG හි අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. අදාළ ආයතන සමගින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව පාලක සභාවේ ද අනුමැතිය ලබා ගෙන මෙම වැඩසටහන් යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

<u>කටාර් දූත කණ්ඩායම් සංචාරය –2019 මාර්තු මස 29 දින</u>

ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන කටාර් රාජ්‍යයෙහි මධ්‍යම මහනගර සභාව, කලාප 242කට අධික ප්‍රමාණයක පලාත් පාලන ආයතන 29ක් නියෝජනය කරමින් සාමාජිකයන් 29කගෙන් සමන්විතව මහනගර සභා කටයුතු සම්බන්ධයෙන් රටේ සංවර්ධනය ඇති කිරීම සඳහා සියලු කටයුතු සිදු කරයි. තාක්ෂණික ඥානය, යහ පාලනය සහ සහයෝගිතා යාන්ත්‍රණය බෙදාහදා ගැනීමේ අභිලාශයෙන් යුතුව දෙරටෙහි අදාල නිලධාරීන් දෙරටෙහි සංචාරයන් හි නියුතු වීම උදෙසා කොළඹ පිහිටි කටාර් රාජ්‍ය තානාපති කාර්යාලය විසින් කටයුතු සම්පාදනය කරන ලදී.

ඒ අනුව, පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් කටාර් රාජ්‍යයේ මධ්‍යම නගර සභාවේ සභාපති ධූරන්දර අතිගරු මොහොමඩ් බින් හමූඩ් ෂාෆි අල්-ෂාෆි මැතිතුමාද ඇතුළු කටාර් රාජ්‍යයෙහි දූත කණ්ඩායම සඳහා "ශ්‍රී ලංකාවෙහි පලාත් පාලන පරිපාලන පද්ධතියෙහි විමධ්‍යගත භාවය" යන මැයෙන් එක් දින වැඩසටහනක් සංවිධානය කරන ලදී.











3.5. ජාතික/ ජාත්‍යන්තර පුහුණු සහ අධ්‍යාපන ආයතන සමඟ සබඳතා

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ජාතික මෙන්ම ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වී පවතී. මෙම සම්බන්ධතාවයන් පවත්වාගෙන ගොස් ඇත්තේ අදාළ දෙපාර්ශ්වයන්ම අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබන ආකාරයකිනි. එසේ ඇති කර ගන්නා ලද සබඳතාවයන් මඟින් විදේශ පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා වන ඉඩකඩ වැඩි කිරීමට පහසුකම් සලසා ඇත. (CLGF) 2018 වසර තුළදී USAID, UN-HABITAT, UNDP, CHRYSALIS, DFAT- ඕස්ට්‍රේලියාව, ලෝක බැංකුව සහ යුරෝපීය සංගමය යනාදී සංවිධාන සමඟින් තොරතුරු හුවමාරු කර ගැනීම පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අපේක්ෂාව වේ.

තවද, 2019 වර්ෂයේදී පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම් සභාව(VTEC) යටතේ ලියාපදිංචි වීමේ හැකියාව ලැබෙන ලද්දේ 1990 අංක 20 දරණ TVE පනත යටතේ ලියාපදිංචි අංක. P01/0881 යටතේය.

3.6. විශේෂ අවස්ථා

3.6.1. 2020 වර්ෂයෙහි පලාත් පාලන ආයතනයන්හි තොරතුරු සන්නිවේදන තාක්ෂණික උපාය මාර්ග සම්බන්ධයෙන් වන ජාතික සම්මන්ත්‍රණය

පරමාර්ථය:

- මෙම සම්මන්ත්‍රණයෙහි මූලික පරමාර්ථය වන්නේ නවීන තාක්ෂණය සහ පරිගනක පද්ධති අනුගත කිරීමට අදාලව පවත්නා ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීමයි. මෙමගින් පරිගනක යෙදුම්වල මූලික සංකල්ප සහ මූලිකාංග මෙන්ම පලාත් පාලන ආයතනයන්හි තීරණ ගැනීමේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණය සම්න්ධයෙන් මූලික දැනුම ලබාදීම මෙන්ම තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැකසීම සම්බන්ධයෙන්, මෙන්ම නව්‍ය විසඳුම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය ක්‍රමවේද ආවරණය කෙරේ.
- තොරතුරු තාක්ෂණය සහ ඒ හා බැඳි තාක්ෂණයන්ට අදාලව කටයුතු කරන පලාත් පාලන ආයතනයන් සහ අදාල අනෙකුත් සංවිධාන වල කටයුතු කරන තේරී පත්වූ සභිකයන් මෙන්ම නිලධාරීන් ගේ දැනුම සහ නිපුනතා වර්ධනය කිරීම සඳහා.

කවුරුන් සඳහාද:

- පලාත් පාලන ආයතනයන්හි තේරී පත් වූ සභිකයින්, පලාත් පාලන ආයතනයන්හි කොමසාරිස් / ලේකම්වරු, තාක්ෂණික නිලධාරීන් / තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් සහ මෙම විෂය සම්බන්ධයෙන් කැමැත්තක් දක්වන පාර්ශවයන්, ලාත් පාලන ආයතනයන්හි ගරු සභිකයන්, රාජ්‍ය සේවයෙහි නියුතු නිලධාරීන් මෙන්ම මෙම පාඨමාලාව හැදෑරීමට කැමත්ත ඇත්තවුන්



අන්තර්ගතය:

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ නැඹුරුව හඳුන්වා දීම
- 2020 දැක්ම
- ඊ - පලාත් පාලනය සහ තවත්
- සහශ්‍රකයේ අභියෝග
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ මානව සම්පත් සංවර්ධනය
- ආදායම් රැස් කිරීම ස්වයංක්‍රීයකරණය කිරීම





4.0 2019 වර්ෂය තුළ ආයතනයේ සමස්ත කාර්යසාධනය

4.1. ආයතනයෙන් ක්‍රියාත්මක කළ ජාතික මට්ටමේ වැඩසටහන් වල සාරාංශය - 2019

වගුව **2**

	බස්නාහිර	වයඹ	උතුරු මැද	සබරගමුව	මධ්‍යම	දකුණ	ඌව	නැගෙනහිර	උතුරු	මුළු අගය
ඉංජිනේරුමය	03	03	03	03	03	03	03	02	02	25
සාමාන්‍ය කලමනාකරණ	03	03	03	03	03	03	03	03	03	27
භෞතික සැලසුම්	03	03	03	03	03	03	03	03	03	27
මූල්‍ය කලමනාකරණ	02	02	02	02	02	02	02	02	02	18
නීති සහ නෛතික	03	03	03	03	03	03	03	03	03	27
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික	03	03	03	03	03	03	03	03	03	27
පර්යේෂණ	01	--	01	01	01	01	01	--	01	07
ඝන අපද්‍රව්‍ය සහ පාරිසරික ආරක්ෂණය	03	02	02	02	02	02	02	02	01	18
එකතුව	21	19	20	20	20	20	20	16	18	**174**

4.2. ඉලක්කගත සහ තත්‍ය ප්‍රතිලාභීන්



රූප සටහන 1

4.3. සියලු අංශයන්හි අයවැයගත ප්‍රතිපාදනය සහ තත්‍ය වියදම



රූපසටහන 2

**** තත්‍ය වියදම් ගණනය කොට ඇත්තේ බදු ප්‍රතිපාදන නොසලකා හරිමිනි.*

4.4. මහා භාණ්ඩාගාර අරමුදල් මූල්‍යමය වශයෙන් උපයෝජනය සංසන්දනය - වර්ෂ 2015, වර්ෂ 2016, වර්ෂ 2017, වර්ෂ 2018 සහ වර්ෂ 2019



රූපසටහන 3

4.5. Profit/Loss for the past few years



රූපසටහන

4.6. ආයතනයෙහි එක් එක් අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු

4.6.1. ඉංජිනේරු අංශය

- වෙන් කළ අයවැය - රු. 3,000,000.00
- පරිහරණය කළ මුදල් ප්‍රමාණය - රු. 1,928,806.96
- සම්පූර්ණ කළ වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව - 24
  (පළාත් මට්ටමේ වැඩසටහන්ද ඇතුළුව)
- තත්‍ය ප්‍රතිලාභීන් - 1303
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය - 64.29%

කේතය **SLILG/07/NL/2018**	**වැඩසටහනේ / ක්‍රියාකාරකමේ නම**	**ඉලක්ක කණ්ඩායම**	**කාල වකවානුව**	**මාසය**	**වැඩසටහන් සංඛ්‍යාව**
E/07/NL/2018/01	දැනුම සහ කුසලතා සංවර්ධන වැඩසටහන (මිනුම් සහ මට්ටම් කිරීම්)	කාර්මික නිලධාරීන් සහ අදාල කාර්ය මණ්ඩලය	දින 02	බ. ප - මාර්තු උ. මැ. ප - මැයි ද. ප. - ජූලි වයඹ ප. - ජූනි නැ. ප. - අගෝස්තු උ. ප. - ඔක්. ඌව ප. - සැප්. මධ්‍යම ප. - අප්‍රේල් සබරගමු ප. - සැප්.	09

E/07/NL/2018/02	දැනුම සහ නිපුනතා සංවර්ධන වැඩසටහන (කොන්ක්‍රීට් තාක්ෂණය, ඉංජිනේරුමය අවශ්‍යතා සඳහා වැඩබිම් පරීක්ෂාවන් හඳුනාගැනීම, සහ අත්තිවාරම)	අදාල කාර්ය මණ්ඩලය / රියැදුරන්	දින 02	බ. ප - මැයි උ. මැ. ප - මැයි ද. ප. - මාර්තු වයඹ ප. - ජනවාරි නැ. ප. - අගෝස්තු උ. ප. - ජූලි ඌව ප. - අප්‍රේල්. මධ්‍යම ප. - ජූනි සබරගමු ප. - පෙබ.	09
E/07/NL/2018/03	දැනුම සහ කුසලතා සංවර්ධන වැඩසටහන පාරිසරික නීතිය (EPL) ක්‍රියාවලිය සහ අධිකරණ ක්‍රියාවලිය	කාර්මික නිලධාරීන් සහ අදාළ කාර්ය මණ්ඩලය	දින 01	බ. ප - ජූනි උ. මැ. ප - මාර්තු ද. ප. - අගෝස්තු වයඹ ප. - ජනවාරි නැ. ප. - ඔක්. උ. ප. - සැප්. ඌව ප. - ජූලි මධ්‍යම ප. - පෙබ. සබරගමු ප. - ඔක්.	09
E/07/NL/2018/04	බලශක්ති අරපිරිමැස්ම සහ ප්‍රමිතියෙන් යුත් නිශ්පාදන හඳුනාගැනීම සඳහා වන දැනුම සහ කුසලතා සංවර්ධන වැඩසටහන	කාර්මික නිලධාරීන් සහ අදාළ කාර්ය මණ්ඩලය	දින 02	ජූනි, ජූලි, අගෝස්තු	03
E/07/NL/2018/05	ප්‍රසම්පාදන ක්‍රමවේදය සහ ඇපකර (ගාස්තු අයකළ පාඨමාලාව)	කාර්මික නිලධාරීන් සහ විෂය භාර නිලධාරී (පුද්ගලයන් 50ක් පමණ)	මාස 03	මාර්තු සිට මැයි දක්වා	01
E/07/NL/2018/06	ඉංජිනේරු ඩිප්ලෝමාව (ගාස්තු අයකළ පාඨමාලාව)	කාර්මික නිලධාරීන් සහ අදාළ කාර්ය මණ්ඩලය (පුද්ගලයන් 50ක් පමණ)	මාස 18	2019 මැයි සිට 2020 නොවැම්බර් දක්වා	

පළාත් පාලන ආයතනවල කාර්මික අංශවල මෙන්ම පළාත් සභාවන්හි ඉංජිනේරු අංශයන්ගේද කාර්යසාධනය වර්ධනය කිරීම පිළිබඳ සම්පූර්ණ වගකීම දරනු ලබන්නේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි ඉංජිනේරු අංශයයි. ආයතනික අභිමතාර්ථයන්ට අනුකූලව සකසන ලද පුහුණුවීම් සහ පර්යේෂණ ක්‍රියාකාරකම් ඔස්සේ මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.





තෝරා ගනු ලැබූ අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුව ඉංජිනේරුවන්ට, වැඩ අධිකාරිවරුන්ට සහ කාර්මික නිලධාරීන්ට ලබා දෙන ලදී. එයට අමතරව, පළාත් සභා වලට අනුයුක්තව සේවය කරන පළාත් ඉංජිනේරුවරුන්ට සහ කාර්මික නිලධාරීන්ට ශක්‍යතා වර්ධනයට අදාළ වන්නා වූ වැඩසටහන්ද පවත්වන ලදී.

4.6.2. පොදු කළමනාකරණය සහ මානව සම්පත් සංවර්ධන අංශය

ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා තෝරා පත් කර ගනු ලබන සභිකයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කළමනාකරණ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ අරමුණින් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පොදු කළමනාකරණ අංශය ස්ථාපිත කොට ඇත. මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ආයතනමය සවිබලගැන්වීමේ වැඩසටහන්වල විශේෂ අවධානය යොමු වී පැවතියේ පළාත් සභා සහ පළාත් පාලන ආයන වල කාලීන ශක්‍යතා වර්ධන අවශ්‍යතා කෙරෙහිය. දේශපාලන නායකයින්, රජයේ නිලධාරීන් සහ සිවිල් සමාජය තුළ බලය බෙදා හැරීම සහ යහපාලනනය පිළිබඳ පොදු අවබෝධය ඉහළ නැංවීම සඳහා මෙහිදී ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ජාතික මට්ටමේ වැඩසටහන් වලට අමතරව, අවශ්‍යතාවයන්ට අනුව ගැලපෙන පරිදි සකස් කළ විශේෂ වැඩසටහන් ද හඳුන්වාදීමට නියමිතය.

- වෙන් කළ අයවැය - Rs. 3,780,000.00
- පරිහරණය කළ මුදල් ප්‍රමාණය - Rs. 2,570,165.35
- සම්පූර්ණ කළ වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව (පළාත් මට්ටමේ වැඩසටහන්ද ඇතුළුව) - 35
- තථ්‍ය ප්‍රතිලාභීන් - 1888
- පරිහරණය කළ අරමුදල් ප්‍රමාණය - 67.99%

ක්ෂේත්‍රය	වැඩසටහනේ / ක්‍රියාකාරකමේ නම	ඉලක්ක කණ්ඩායම	කාල වකවානුව	මාසය	වැඩසටහන් සංඛ්‍යාව
GM/01	සබඳතා කලමනාකරණය යටතේ මහජන සබඳතා පිළිබඳ වැඩමුළුව	තේරීපත් වන සභිකයින් / කොමසාරිස් , සභාවේ ලේකම්වරුන් / පරිපාලන නිලධාරීන්	මාස 12	ජනවාරි- දෙසැම්බර්	09
GM/02	කාර්යසාධන කලමනාකරණය සහ අධීක්ෂණය පිළිබඳ වැඩමුළුව	පරිපාලන නිලධාරීන් / විෂයයට අදාල ලිපිකරුවන්	මාස 12	ජනවාරි - දෙසැම්බර්	09
GM/03	මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ToT	තේරී පත් වන සභිකයින් / කොමසාරිස් / සභාවේ ලේකම්වරුන් / පරිපාලන නිලධාරීන්, සංවර්ධන නිලධාරී / සුළු සේවක මණ්ඩලය	මාස 12	ජනවාරි- දෙසැම්බර්	09
GM/04	මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන	තෝරාගත් නිලධාරීන් සඳහා	මාස 03	මැයි - ජූලි	01







මෙම අංශයෙහි අභිමතාර්ථ ,

- යහපාලනය ඇති කිරීම උදෙසා පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට තේරී පත් වන සභිකයන් සහ ඒවායේ කාර්යමණ්ඩලය සතු කළමනාකරණ කුසලතාවයන් වැඩි දියුණු කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තෝරා පත් කර ගනු ලබන සභිකයන්ට සහ ඒවායේ කාර්ය මණ්ඩලයට ස්වකීය කාර්යසාධනය වැඩි දියුණු කර ගත හැකි වන සේ ශක්‍යතා වර්ධනය සිදු කිරීම සහ ප්‍රජාව වෙත වඩා ප්‍රශස්ත රාජ්‍ය සේවයක් සැපයීමට හැකි වන පරිදි ආකල්ප වෙනස් කිරීම.
- උප ජාතික මට්ටමේදී සංවර්ධනය සඳහා පවතින බාධක වෙතොත් ඒවා පිටුදැකීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශ අතර හවුල්කාරිත්වය වර්ධනය කිරීම.
- මහජනතාව සඳහා වඩා යහපත් සේවයක් ලබා දීම සඳහා සහ අනෙකුත් පාරිභෝගිකයන් තෘප්තිමත් කිරීම සඳහා ආයතනවල කාර්යක්ෂමතාවය, සාධනීයභාවය සහ ඵලදායිත්වය ඉහළ නැංවීම.

සෑම වසරකදීම ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කරනු ලබන්නේ රට තුළ මෙන්ම කලාපය තුළද පවතින පළාත් පාලනය සම්බන්ධයෙන් වන යහ පරිවයන් සියුම්ව සලකා බැලීමෙන් සහ පරීක්ෂා කිරීමෙන් අනතුරුවයි. විශේෂයෙන්ම, දැනට පවත්නා වාතාවරණය සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පවතින ශක්‍යතා මට්ටම් මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ.

4.6.3. භෞතික සැලසුම් අංශය

භෞතික සැලසුම් අංශයේ කර්තව්‍යයන් ක්‍රියාත්මක වීම 2003 වර්ෂයේ ආරම්භ විය. උවමනාවන් අධ්‍යනය කිරීමත් අවශ්‍යතාවයන් තක්සේරු කිරීමත් සිදු කිරීමෙන් පසු මොඩියුල පිළියෙල කිරීම ආරම්භ වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2004 වර්ෂයේ සිට පුහුණු වැඩසටහන් ආරම්භ විය. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි පර්යේෂණ අංශය මගින් සිදුකරන අවශ්‍යතා තක්සේරු කිරීම් සමගින් පුහුණු වැඩසටහන් වාර්ෂිකව සංශෝධනයට ලක් විය. පූර්ණකාලීනව

සේවයේ නියුතු උපදේශකවරයෙකුගේ නායකත්වයෙන් ක්‍රියාත්මක මෙම අංශයට භෞතික සැලසුම් නිලධාරියෙකුගේ සහාය ද සැලසේ. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, ස්ථාන හඳුනා ගැනීම , කාර්යක්ෂම සහ සාධාරණ අයුරින් ඉඩම් භාවිතය, සහ ඉඩම් භාවිතාව හා ගොඩනැගිලි සැලසුම් සම්බන්ධයෙන් වන නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම යන කර්තව්‍යයන් පළාත් පාලන ආයතන වලට පැවරී ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) සහ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ (NPPD) නීති සහ අනෙකුත් අදාළ නීති ආඥාපනත් සහ නීති ප්‍රතිසංස්කරණ වලට අනුකූලව පළාත් පාලන ආයතන විසින් සැළසුම් පිළියෙල කිරීම අපේක්ෂිතය. එබැවින් සංවර්ධන පසුතලයක් පදනම් කරගනිමින් මෙම අංශය විසින් පළාත් පාලන ක්‍රියාකාරකම් වල ඉතා වැදගත් ක්ෂේත්‍රයක් ආවරණය කරනු ලැබේ.

2019 වර්ෂයේදී ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව ආරම්භ කරන ලද සහතිකපත්‍ර පාඨමාලාවට (ගාස්තු අය කිරීම්) අමතරව පහත කටයුතු මෙමගින් සිදු කෙරේ.

ක්ෂේත්‍රය	**වැඩසටහනේ / ක්‍රියාකාරකමේ නම**	**ඉලක්ක කණ්ඩායම**	**කාලවකවානුව**	**මාසය**	**වැඩසටහන් සංඛ්‍යාව**
PP/13/NL/2019-01	පළාත් පාලන ආයතනවල භෞතික සැළසුම්කරණය පිළිබඳ වැඩමුළු	පළාත් පාලන ආයතන වල සභිකයන් , මහ නගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභා / පලාත් පාලන ආයතනයන්හි කොමසාරිස්, ලේකම් EOs, DAs, CDOs, TO යන නිලධාරීන්	දින 02	ජනවාරි - මැයි	වැඩසටහන් 09 (ද්‍රවිඩ මාධ්‍ය 02)
PP/13/NL/2019-02	පළාත් පාලන ආයතනවල භෞතික සැළසුම්කරණය, සංවර්ධන කටයුතු සහ ආදායම් උත්පාදනය පිළිබඳ වැඩමුළු	පළාත් පාලන ආයතන වල සභිකයන් , මහ නගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභා / පලාත් පාලන ආයතනයන්හි කොමසාරිස්, ලේකම් EOs, DAs, CDOs, TO යන නිලධාරීන්	දින 02	මැයි - අගෝස්තු	වැඩසටහන් 09 (ද්‍රවිඩ මාධ්‍ය 02)
PP/13/NL/2019-03	නාගරික සැලසුම් මූලධර්ම සහ පුරුදු පලාත් පාලන ආයතනයන්ට අනුගත කිරීම පිළිබඳ වැඩමුළුව	පළාත් පාලන ආයතන වල සභිකයන් , මහ නගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභා / පලාත් පාලන ආයතනයන්හි කොමසාරිස්, ලේකම් යන නිලධාරීන්	දින 02	සැප් - නොවැ	වැඩසටහන් 09 (ද්‍රවිඩ මාධ්‍ය 02)
